# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2025

10 ශ්‍රේණිය

**ඉතිහාසය - II පත්‍රය**

නම ...................................................................................... කාලය පැය 03 යි

❖ **උපදෙස්**

➢ I **කොටසින් පළමුව ප්‍රශ්නය අනිවාර්යවේ**

➢ II **කොටසෙන් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

- **පිළිතුරු සැපිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 6කි.**

**I කොටස**

**01.** **(අ).** පහත **(i)** යටතේ දක්වා ඇති සියලු ඓතිහාසික ස්ථාන සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේද, **(ii)** යටතේ දක්වා ඇති සියලු ඓතිහාසික ස්ථාන සපයා ඇති ලෝක සිතියම් කොටසෙහිද ලකුණු කර නම් කරන්න.

**(i)** යාන් ඔය, මා තොට, පදවිය වැව, පොළොන්නරුව, දේවනගර, යාපනය, ගෝකණ්ණතිත්ථ, ගෝණනදී, මහනුවර, බුන්දල, පොතාන, සූකරතිත්ථ (ලකුණු- 1X12=12)

**(ii)** රතු මුහුද, මලය අර්ධද්වීපය, කැලිකට්, බතාවිය, මක්කම, තුර්කිය (ලකුණු- 1X6=06)

**(අ). (i)** පහත A,B,C,D, වල දැක්වෙන ඓතිහාසික සිදුවීම් වලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ලියා දක්වන්න.

**A.** **I** විජයබාහු රජුට ළමා කාලයේදී රැකවරණය ලබා දුන් ආරක්ෂක නිලධාරියාගේ නම

**B.** ඊළඟ කණ්නයේදී ලබාදෙන පොරොන්දුව මත ගම්වැසියෙක් ගමිකගෙන් වී මල්ලක් ඉල්ලාගත් තොරතුර දැක්වෙන මූලාශ්‍රය

**C.** වැටකින් ආවරණය කළ ගම්මාන හැඳින්වූ නම

**D.** වැව් ජලය පරිහරණය කරන්නන්ගෙන් අතීතයේ අය කළ බද්ද හැඳින්වූ නම (ලකුණු- 1X4=04)

**(ii)** **A** හා **B** යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්න වලටද පිළිතුරු අංක අනුපිළිවලින් ලියන්න.



01. මෙම රූපය හඳුනාගෙන නම් කරන්න

02. එම රූපයෙන් දැක්වෙන දෙය හමු වූ ස්ථානය නම් කරන්න.

03. ඒ සඳහා පබළු ආනයනය කළ රට නම් කරන්න

04. මෙම මාලය පරිහරණය කළ ජනතාව ජීවත් වූ මානව අවදිය නම් කරන්න

(ලකුණු- 1X4=04)

**(iii)** 01. මෙම නිර්මාණය නම් කරන්න



02. එම නිර්මාණය සඳහා භාවිතා කර ඇති අමුද්‍රව්‍ය සඳහන් කරන්න

03. මෙම ගොඩනැගිල්ල භාවිතා කර ඇති ආගමික කණ්ඩායම නම් කරන්න.

04. මෙහි දැකිය හැකි ගෘහ නිර්මාණ ශෛලිය ලියා දක්වන්න.

(ලකුණු- 1X4=04)

**02.** **(i)** පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

**(a)** ලංකාවේ පැරණිම වංශ කතාව නම් කරන්න.

**(b)** මහාවංශයට රචනා කළ ටීකාව හැඳින්වෙන නම ලියන්න.

**(c)** ලංකාවේ සිතියමක් මුල් වරට නිර්මාණය කළ භූගෝල විද්‍යාඥයා නම් කරන්න

(ලකුණු- 1X3=03)

**(ii)** ලංකාවේ ඉතිහාසය හැදෑරීමට ඉවහල් වන දකුණු ඉන්දීය මූලාශ්‍ර දෙකක් චීන මූලාශ්‍රයක් හා අරාබි මූලාශ්‍රයක් නම් කරන්න. (ලකුණු- 1X4=04)

**(iii)** පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර විනාශය වන ක්‍රම දෙකක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු- 05)

**(iv)** ඉතිහාසය හැදෑරීමේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර හා සාහිත්‍ය මූලාශ්‍රවල වැදගත්කම කරුණු 03ක් ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු- 6)

**03.** **(i)** ප්‍රාග් ඓතිහාසික මානවයන් ජීවත් වූ පරිසර කලාප තුනක් නම් කරන්න. (ලකුණු- 3)

**(ii)** පහත සඳහන් ගම්මාන වර්තමානයේ හඳුන්වන නම් ලියන්න

**1.** කසීකාර ගාම

**2.** මණීකාර ගාම

**3.** කෝවට්ට ගාම

**4.** වඩ්ඪකී ගාම (ලකුණු- 1X4=04)

**(iii)** පූර්ව ඓතිහාසික යුගයේ මානවයින්ගේ තාක්ෂණය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු- 05)

**(iv)** මුල් ඓතිහාසික යුගයේ ජනතාවගේ ජානාවාස වල ව්‍යුහය හා ස්වරූපය කරුණු තුනක් ඇසුරින් දක්වන්න.

(ලකුණු- 06)

04. (i) පහත සඳහන් සිදුවීම් සම්බන්ධ රජවරුන්ගේ නම් ලියා දක්වන්න

1. අනුරාධපුරය පළමුවරට අගනගරයක් බවට පත්කළ රජතුමා

2. ලම්බකරණ රජ පෙළපතේ ආරම්භක රජතුමා

3. ලංකාවේ පළමුවරට සංවිධානාත්මක සටන් ව්‍යාපාරයක් ගෙන ගිය රජතුමා (ලකුණු- 1X3=03)

(ii) අතීතය ලංකාවේ රජවරුන් සම්බන්ධයෙන් භාවිතා වූ රාජ්‍යත්ව සංකල්ප දෙකක් ලියා එම සංකල්ප භාවිතා කළ රජවරුන් එක් අයෙකු බැගින් නම් කරන්න (ලකුණු- 1X4=04)

(iii) දෙවන පැතිස් රජතුමා ලංකාවේ සමකාලීනව විසූ ක්ෂත්‍රිය නායකයින් දිනා ගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු- 5)

(iv) වසභ රජතුමාගේ දේශපාලන ආර්ථික හා ආගමික සේවාවන් එක බැගින් ලියා කෙටියෙන් විස්තර කරන්න (ලකුණු- 3)

05. (i) ඕනෑම රටක පාලනය මෙහෙයවන ආයතන තුන නම් කරන්න

(ii) පහත සඳහන් වචන වල අර්ථය ලියන්න

1. වන්හිමියන් වහන්සේ

2. සභාය

3. මහලේ

4. එක්තැන් සමිය (ලකුණු- 1X4=04)

(iii) ලංකාවේ අතීතයේ විසූ බුද්ධිමත් රජවරු ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීමට දැඩි කැපවීමෙන් කටයුතු කළහ මේ සඳහා උදාහරණ දෙකක් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු- 5)

(iv) ලංකාවේ අතීත රජවරුන් දූරදර්ශීව කටයුතු කරමින් යහපත් විදේශ සම්බන්ධතා ගොඩනගා ගත්හ ඒ සඳහා උදාහරණ තුනක් දක්වමින් පැහැදිලි කරන්න (ලකුණු- 6)

06. (i) පහත සඳහන් වචන වලින් හඳුන්වන ලද්දේ මොනවාදැයි ලියා දක්වන්න

1. වජ චුම්බට

2. මොහොල් නගා

3. අඩික (ලකුණු- 1X3=03)

(ii) වැවක ප්‍රධාන අංග දෙකක් දක්වා ඒවායේ කෙරෙන කාර්යයන් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු- 4)

(iii) අතීත ලංකාවේ මුතුන් මිත්තන් සතුව දියුණු වාස්තු විද්‍යාත්මක දැනුමක් පැවතී බව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු- 5)

**(iv)** අතීතයේ මෙරට විසූ ජනතාව සතුව දියුණු මැනීමේ හා ගණන කිරීමේ ක්‍රමවේද පැවති බව උදාහරණ තුනක් දක්වමින් පැහැදිලි කරන්න (ලකුණු- 6)

**07.** **(i)** පැරණි සමාජ ධූරාවලිය තුළ නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ නොවී නිෂ්පාදනය භුක්තිවිඳි පාර්ශව තුනක් ලියන්න (ලකුණු- 3)

**(ii)** පැරණි සමාජය තුළ සාධාරණ වෙළඳාමක් උදෙසා රජු මැදිහත් වූ අයුරු දැක්වෙන සොරබොරවැව ටැම් ලිපියේ සඳහන් කරුණු දෙකක් ලියන්න (ලකුණු- 4)

**(iii)** යහපත් නීතිගරුක සමාජයක් ගොඩනැගීමට රජවරුන් විසින් විවිධ නීති වර්ග පනවා තිබූ අතර එසේ ජනතා සුභ සිද්ධිය උදෙසා පනවා තිබූ නීති සඳහා උදාහරණ දෙකක් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු- 5)

**(iv)** අතීත සමාජයේ විසූ කාන්තාවට සමාජය තුළ මහත් ගෞරවයක් පිළිගැනීමක් පැවතිණි මේ බව සනාථ කිරීමට උදාහරණ තුනක් දක්වමින් විස්තර කරන්න (ලකුණු- 6)

**08.** **(i)** පැරණි සෙල්ලිපි වල පහත සඳහන් සංකේතවලින් නිරූපණය වූ අර්ථය ලියාා දක්වන්න

**1.** ඉර හඳ

**2.** වටාපත/සෙංකෝලය

**3.** බල්ලන් හා කපුටාන් (ලකුණු- 1X3=03)

**(ii)** පැරණි සමාජයේ භාවිතා වූ පහත සඳහන් වචනවල අර්ථය ලියා දක්වන්න

**1.** භාණකවරු

**2.** සීවික ශාලා

**3.** වාණිජ

**4.** පූගය (ලකුණු- 1X4=04)

**(iii)** "පැරණි ලංකාවේ හේන් ගොවිතැන ගොවියාගේ ස්වයං පෝෂිත ජීවන රටාවේ කැඩපතයි." මෙම කියමන කරුණු දෙකක් ඇසුරින් සනාථ කරන්න (ලකුණු- 5)


**(iv)** අතීතයේ මෙරට විසූ විවිධ ජන වර්ග ඉතා සමගියෙන් ජීවත් වූ බව කරුණු තුනක් ඇසුරින් දක්වන්න

(ලකුණු- 6)

(ඇ) (i)

(அ) (i)

(a) (i)


යුරෝපය
ஐரோப்பா
Europe
අප්‍රිකාව
ஆபிரிக்கா
Africa
ඉන්දියන් සාගරය
இந்து சமுத்திரம்
Indian Ocean
උ

1. (අ) (i)
1. (அ) (i)
1. (a) (i)

